**මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව**

**පුරප්පාඩු**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික නිලධාරී (11 ශ්‍රේණිය)**

අවශ්‍ය සුදුසුකම් - (I) (අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් 1975 වසරේ සිට පිරිනමන ලද විශේෂ ඉංජිනේරු ආධුනිකත්ව සහතිකය හෝ 1989 වසරේ සිට පිරිනමන ලද ඉංජිනේරු තාක්ෂණිකයින් සඳහා වන ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ ඉලෙක්ට්‍රොනික හෝ බලශක්ති ක්ෂේත්‍රය සඳහා සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනය විසින් පිරිනමා ඇති අවසාන සහතිකය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම

හෝ

(ආ) බහු තාක්ෂණික ආයතනයකින් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමා ඇති අධ්‍යාපන තාක්ෂණවේදී ඩිප්ලෝමා හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්ප ක්‍රමය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබිම සහ ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.(ඉහත ඩිප්ලෝමා පාඨමාලාව වසර 02 ක කාලයකට නොඅඩු විය යුතුය.)

හෝ

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂයයන් 03 ක් සමත්වීම සහ වසර 06 ක ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

වයස - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය - රු. 42,590-20x615;1x615-55,505/- (මාසික) U-MN 4 (11)

(කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (v) අනුව 2020 වර්ෂයට අදාල වැටුප් ක්‍රමය වේ.

**මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනිකුත් අනුමත දීමනාවන් ද ගෙවනු ලැබේ.)

02. **කම්මල්කරු (11 ශ්‍රේණිය)**

අවශ්‍ය වෘත්තීය සුදුසුකම්: (I) කියවීමට හා ලිවීමට ඇති හැකියාව.

(II) (අ) ගිනියම් කළ පැස්සුම්වලින් විවිධ මාදිලියේ පිරිවැද්දුම් ගැන දැනීම.

(ආ) ගල් අඟුරු වැනි ඛනිජවලින් ඇති කරන නොයෙක් විධියේ තාපක උපචාර හා අත්හද බැලීම් ගැන දැනීම.

(ඇ) පන්නරය තැබීම හා වානේ දුනු සෑදීමේ ක්‍රියාවලිය ගැන දැනීම.

(ඈ) කම්මල් කරු වෘත්තියේදී පාවිච්චි කරන උපකරණ යෙදවීමේ හැකියාව යන ආරක්ෂක කටයුතු ගැන දැනීම

(III) අවුරුදු දෙකකට නොඅඩුව කම්මලක ලබා ඇති පළපුරුද්ද.

වයස - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය - රු.24,209-16x218-27,697/-(මාසික) U-PL 3(III)

(කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2018 වර්ෂයට අදාල වැටුප් ක්‍රමය වේ.)

**මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනිකුත් අනුමත දීමනාවන් ද ගෙවනු ලැබේ.)

03. <u>ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කරන්නා (11 ශ්‍රේණිය)</u>

අවශ්‍ය සුදුසුකම්: (I) කියවීමේ හා ලිවීමේ හැකියාවන් තිබිය යුතුය.

(II) (අ) සුළුසැරි සටහන් (Simple circuit diagrams) හා විදුලි කම්බි සටහන් කියවීමට හා තේරුම් ගැනීමට හැකියාවක් තිබිය යුතුය.

(ආ) සංඥා ජනක (Signal Generatores) බහුමානක Multimeters) කැතෝඩ් කිරණ ඔසිලොස්කොප්ස් (cathode ray Oscilopes) යනාදී ඉලොක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කිරීම සඳහා නිතර භාවිතා කරන අත්හද බැලීමේ උපකරණ පාවිච්චි කිරීම ගැන හැකියාවක් තිබිය යුතුයි.

(ඇ) දී ඇති සැරිසටහන් අනුව පැහැදිලිව සැලසුම් කර රයම්වලින් පැස්සුම් කර ඉලෙක්ට්‍රොනික් සැරි සකස් කිරීමේ හැකියාවක් තිබිය යුතුයි.

(III) ඉහත අදල වැඩ ගැන අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

<u>**සටහන**</u> 07 වැනි ප්‍රමාණය සමත් වී ඇති අයවලුන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

වයස - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් ක්‍රමය - රු.24,209-16x218-27,697/-(මාසික) U-PL 3(III)

(කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2018 වර්ෂයට අදල වැටුප් ක්‍රමය වේ)

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනිකුත් අනුමත දීමනාවන් ද ගෙවනු ලැබේ.)

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.08 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ආයතන (අනධ්‍යයන) වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරී නමට ලිපිනය ලියූ රු. 45.00 ක මුද්දර ඇලවූ 25.5 සෙ.මී.x 10 සෙ.මී. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හී, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

මෙම තනතුරු ලිඛිත/ ප්‍රායෝගික/ වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවාගනු ලැබේ.

වැඩ බලන ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2018.12.12